| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>Education Zone - Piliyandala | | | |
|---|---|---|---|
| වර්ෂ මැද ඇගයීම - 2017<br>Mid Year Evaluation | | | |
| ශ්‍රේණිය / Grade } 6 | විෂයය / Subject } ඉතිහාසය | පත්‍රය / Paper } I | කාලය / Time } පැය 02යි |

නම ..................................................  විභාග අංකය ......................

සැළකිය යුතුයි:

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 තෙක් ප්‍රශ්න වල දී පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) පහත සඳහන් මූලාශ්‍ර අතරින් සාහිත්‍ය මූලාශ්‍රයක් නොවන්නේ කුමක්ද?

1. මහාවංශය
2. රසවාහිනිය
3. ථූපාරාමය
4. කව්සිළුමිණ

02) බුද්ධ වර්ෂ ආරම්භ වන්නේ බුදුන් වහන්සේගේ

1. ඉපදීම සිදුවූ දින සිටය
2. බුදුවීම සිදුවූ දින සිටය
3. පරිනිර්වාණය සිදුවූ දින සිටය
4. දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළ දින සිටය

03) ලෝකයේ මුල්ම ජීවීන් බිහිවී ඇත්තේ ,

1. පසේය
2. ජලයේය
3. ආකාශයේය
4. වනාන්තර වලය

04) මීට අවුරුදු දස ලක්ෂ හාරසීය විස්සකට අයත් කාලය හඳුන්වනු ලබන්නේ,

1. හිම යුගය නමිනි
2. පැලියෝසොයික නමිනි
3. පූර්ව ශිලා යුගය නමිනි
4. සිලූරියන් යුගය නමිනි

05) ගිනි කඳු පුපුරන විට ඉන් පිටතට ගලා එන්නේ,

1. අඟුරුය
2. දූවිලිය
3. ලාවාය
4. ගින්දරය

06) **පෘථිවිය මත මැමත් අලි ජීවත් වූයේ,**

i. මහා හිම යුගයේදීය ii. මධ්‍යශිලා යුගයේදීය
iii. සිලුරියන් යුගයේදීය iv. පැලියොසොයික යුගයේදීය

07) **හිජ්රි වර්ෂ ක්‍රමය තමන්ගේ ආගමික උත්සව පැවැත්වීමේදී කාලය මැනගැනීමට භාවිතා කරන්නේ,**

i. හින්දූන්ය
ii. මුස්ලිම්වරුන්ය
iii. ඉංග්‍රීසීන්ය
iv. ඉන්දියානුවන්ය

08) **නව ශිලා යුගයේ ඇතිවූ වෙනස් කමක් නොවන්නේ,**

i. ගොවිතැන පුරුදුවීමය
ii. දුනු ඊතල භාවිතයෙන් දඩයම් කිරීමය
iii. සතුන් හීලෑ කරගැනීමය
iv. ලෝහ වර්ග සොයා ගැනීමය

09) **කඩදාසි සහ මුද්‍රණ යන්ත්‍රය මුලින්ම ලෝකයට හඳුන්වා දෙන ලද්දේ,**

i. ඊජිප්තු ශිෂ්ටාචාරයේ ජනතාව විසින්
ii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ජනතාව විසින්
iii. මායා ශිෂ්ටාචාරයේ ජනතාව විසින්
iv. චීන ශිෂ්ටාචාරයේ ජනතාව විසින්

10) **මෙසපොතේමියානු වැසියන් සුළඟට හා ගොවිතැනට අධිපති දෙවියා ලෙසින් සැළකුවේ,**

i. අග්නිය ii. අනුය
iii. ඌර්ය v. එන්ලිලීය

අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළ දී ඇති වචන යොදා ගනිමින් පුරවන්න,

11) පෘථිවිය සෑදෙන්ට ඇතැයි විශ්වාස කරන දූවිලි වලාවක් හැඳින්වෙන්නේ ........................................ නමිනි. (පොසිලයක් / නිහාරිකාවක් )

12) ශාකවර්ග මුලින්ම ගොඩබිම පැතිර ගියේ ........................................ නමින් හැඳින්වන යුගයකදීය. (සිලුරියන් / පැලියසොයික )

13) ඉතිහාසයට අනුව විජය ඇතුලු පිරිස ලක්දිවට පැමිණ ඇත්තේ ........................................ සිටය. (උතුරු ඉන්දියාවේ / දකුණු ඉන්දියාවේ )

14) පළමුවරට රබර් බෝලයක් ........................................ අයක් වැසියන් විසින් සාදන ලදී. (මායා ශිෂ්ඨාචාරයට / ඊජිප්තු ශිෂ්ඨාචාරයට )

15) මෙසපොතේමියාවේ උතුරු කොටසේ ........................... ජීවත් වී ඇත. (පිග්මිවරු /ඇසිරියන්වරු)

අංක 16 සිට 20 දක්වා වගන්ති හරි නම් ( √ ) ලකුණද වරදි නම් ( × ) ලකුණද ඉදිරියෙන් ඇති හිස්තැනෙහි යොදන්න,

16) මෙසපොතේමියා යන වචනයේ අදහස වන්නේ ගංගා දෙකක් මැදිවන සේ පිහිටි රට යන්නයි. ( )

17) ඔස්ට්‍රලෝපිතිකස් විශාල සුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස ඉදිකළේය. ( )

18) දොලවීර හා කාලිබන්ගන් යනු ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් නගර දෙකකි. ( )

19) පාරාවෝ රජවරුන්ගේ මළ සිරුරු තැන්පත් කරන ලද්දේ පිරමීඩවලය ( )

20) ඉතිහාසය අනුව විජය සමඟ මෙරටට පැමිණි පිරිස නවසීයකි. ( )

| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>Education Zone - Piliyandala | | | |
|---|---|---|---|
| වර්ෂ මැද ඇගයීම - 2017<br>Mid Year Evaluation | | | |
| ශ්‍රේණිය<br>Grade } 06 | විෂයය<br>Subject } ඉතිහාසය | පත්‍රය<br>Paper } II | |

නම .................................................  විභාග අංකය ....................

සැළකිය යුතුයි:

- ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01) i. ඔබේ පාසලේ ඉතිහාසය දැනගැනීමට උපකාරී වන මූලාශ්‍ර දෙකක් නම් කරන්න
( ලකුණු 02 )

ii. පහත දැක්වෙන මූලාශ්‍ර අතරින් ,

**A** සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් ද

**B** පුරා විද්‍යාත්මක මූලාශ්‍ර දෙකක්ද තෝරා ලියන්න.

සඳකඩපහන, මුරගල, මහාවංශය, රසවාහිනිය, ථූපාරාමය, කුට්ටම් පොකුණ, සද්ධර්ම රත්නාවලිය ( ලකුණු 04 )

iii. ඉතිහාසය විෂය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
( ලකුණු 06 )

02) i. රූපය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිරු ලියන්න.



**A** මෙම රූපයේ දැක්වෙන්නේ ඉපැරණි සත්ත්ව සළකුණකි. මෙම සත්වයා හැඳින්වෙන නම කුමක්ද?

**B** මෙම සත්ව සළකුණ සොයාගෙන ඇති රට කුමක්ද?

( ලකුණු 02 )

ii. පෘතුවියේ උපත සිද්වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 04 )

iii. මිනිසා අනෙක් සතුන් අභිබවා දියුණු වූ ආකාරය පැහැදිලි කරන්න ( ලකුණු 06 )

03) i. පුරාශිලායුගයේ ජීවත් වූ මානවයන් අනුගමනය කල ප්‍රධාන අවමංගල කටයුත්තක් සඳහන් කරන්න. ( ලකුණු 02 )

ii. පුරාශිලා යුගයෙන් මධ්‍යශිලා යුගයට පිවිසි මානවයාගේ ක්‍රියාකාරකම්වල ඇතිවූ වෙනස්කම් දෙකක් ලියන්න. ( ලකුණු 04 )

iii. නව ශිලා යුගයේ ජීවත් වූ මානවයන්ගේ ජීවන රටාවේ ඇති වූ දියුණුව කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 06 )

04) i. පහත A, B, වශයෙන් දැක්වෙන ධාන්‍ය වර්ග මුල්වරට වගාකළ ප්‍රදේශ පිළිවෙලින් ලියන්න

A - බඩඉරිඟු
B - වී ( ලකුණු 02 )

ii. මුහුනේ ස්වරූපය අනුව හෝමෝ සාපියන් මානවයා බෙදෙන වර්ග හතරක් නම් කරන්න. ( ලකුණු 04 )

iii. ගොවිතැන් කිරිමෙන් අස්වැන්න ලබාගත් පසු ආදී මිනිසා සිදුකළ ක්‍රියාකාරකම් මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 06 )

05) i. අතීත නගරයක තිබූ ලක්ෂණ දෙකක් නම් කරන්න. ( ලකුණු 02 )

ii. ශිෂ්ටාචාරයක් යනු කුමක්දැයි උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.( ලකුණු 04 )

iii. බොහෝ පැරණි ශිෂ්ටාචාර ගංගා ආශ්‍රිතව බිහිවීමට හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 06 )

06) i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙන් වර්තමාන ලෝකයට ලැබුණ දායාද දෙකක් සඳහන් කරන්න. ( ලකුණු 02 )

ii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර 4ක් නම් කරන්න. ( ලකුණු 04 )

iii. ඊජිප්තු ශිෂ්ඨාචාරයේ විශේෂ ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 06 )

07) i. පහත සඳහන් A හා B කරුණු වලට අදාළ පිළිතුරු සඳහන් කරන්න.

A - විජය කුමරු ඇතුලු පිරිස මෙරටට ගොඩබසින ලද ප්‍රදේශය
B - විජය කුමරුන් විසින් විවාහ කරගන්නා ලද යක්ෂ ගෝත්‍රික කාන්තාව ( ලකුණු 02 )

ii. විජය කුමරු සමග පැමිණි ප්‍රධාන අමාත්‍යවරු හතර දෙනෙකු නම් කරන්න ( ලකුණු 04 )

iii. අනුරාධපුර රාජධානියේ දියුණුවට පන්ඩුකාභය රජු විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 06 )